**ගොඩනැගිලි දෙපාර්තමේන්තුව**

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2018

**නිවාස , ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

## විධායක සාරාංශය

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාව තුළ රජයේ ගොඩනැගිලිවල සැලසුම් සහ ඉදිකිරීම් සම්බන්ධව වග කියන ප්‍රමුඛ රජයේ ආයතනය ලෙස දශක 5කට ආසන්න කාලයක් කටයුතු කරමින් සිටී. මේ වන විට, වෙනස් වෙන ආර්ථිකයට සහ තාක්ෂණයට ගැලපෙන ලෙස සංවර්ධනය කර ඇති රජයේ දෙපාර්තමේන්තු අතුරින් එකක් වීමට අප ආයතනය සමත් වී ඇත. ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික වගවීම වෙත විශේෂ අවධානයක් යොදවමින් දෙපාර්තමේන්තුව තම වගකීම සහ මෙහෙවර ප්‍රකාශය ප්‍රති අර්ථකථනය කර ගෙන යනු ඇත.

මෙම කාර්ය සාධන වාර්තාව සකසා ඇත්තේ වැඩි දියුණු වූ කාර්ය සාධනය සඳහා ඉලක්ක සැකසීම, ශ්‍රම බලකාය අධීක්ෂණය, පාලනය සහ සමාලෝචනය, අනුකූලතාව ප්‍රදර්ශනය කිරීම, බාහිර වාර්තා සැකසීම, කාර්ය සාධනය වැඩි දියුණු කිරීම, සහ ඉංජිනේරුවරුන්, සේවාදායකයින් සහ කොන්ත්‍රාත්කරුවන් අතර සන්නිවේදනය වැඩි දියුණු කිරීම යන අරමුණු සහිතවය.

අතීත කාර්ය සාධනය හා සාපේක්ෂව ගත් විට 2018 වසරේ කාර්ය සාධනය ඇගයිය යුතු මට්ටමක පවතින අතර ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ව්‍යාපෘති ගණනද වැඩි වී ඇත. කලාප 7 තුළම ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති සාරාංශගත කර ඇත. පුනරාවර්තන වියදම්වල සහ ප්‍රාග්ධන වියදම්වල සාරාංශය මගින් පෙන්වන පරිදි අනෙකුත් සමාන ආයතනවලට සාපේක්ෂව, නිමැවුම පිරිවැය ඵලදායී වන අතර කාර්යක්ෂමද වේ.

වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනේ කාර්ය සාධනය එහි ඉලක්කයට සාපේක්ෂව ගත්විට ගිවිසුම් කාලය තුළ ඉලක්කයට ළඟා වී ඇති අතර කාර්ය සාධනය සහ වැඩ ගුණාත්මක බව වැඩි කිරීමට සමාලෝචනයද සිදු කරයි. විවිධ වෘත්තිකයින්ගෙන් සමන්විත දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය, ලැබී ඇති සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කරමින් ඉහළ සේවාවන් ලබාදෙයි. උපරිම කාර්යක්ෂමතාවක් තුලින් දෙපාර්තමේන්තුවේ ඉලක්ක ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීමට දෙපාර්තමේන්තුව උත්සාහ දරයි. විවිධ බාහිර සහ අභ්‍යන්තර පුහුණු වැඩසටහන් පවත්වමින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ දැනුම වර්ධනය කර ගෙන යනු ලබයි. වාර්ෂික විගණන සැලසුම අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් පරිපාලනය, මූල්‍ය සහ වෙනත් කටයුතු විගණනය සිදු කරන ලදී

වර්තමාන අවශ්‍යතාවයන් සම්බන්ධව කටයුතු කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයන් නැවත සකස් කිරීමට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව පිළිබඳව අධ්‍යයනයක් අවශ්‍ය වූ අතර අනාගතයේදී රජයට සම්බන්ධ සියලු ව්‍යාපෘති භාර ගැනීමේ ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට ආයතනය කටයුතු කරමින් සිටී.

## පටුන


- හැඳින්වීම ..... 3
    - සංස්ථානික තොරතුරු ..... 3
    - දැක්ම ..... 4
    - මෙහෙවර ..... 4
    - තත්ව ප්‍රතිපත්තිය ..... 4
- අධිකාරිය සහ වගකීම ..... 5
- දෙපාර්තමේන්තුවේ සහතිකය ..... 5
- කළමනාකාරීත්ව ධූරාවලිය ..... 6
- සපයන සේවාවන් ..... 7
    - කලාප කාර්යාල ..... 8
- අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රකාශය ..... 8
- 2018 දක්වා අතීත කාර්ය සාධනය ..... 10
- 2018 වසරේ ව්‍යාපෘති වල සාරාංශය ..... 12
- උපදේශක අංශයේ කාර්ය සාධනය ..... 13
- අත්තිකාරම් ගිණුමේ දක්වා ඇති සීමාවන්ගේ සත්‍ය ප්‍රකාශනය - 2018 ..... 14
- ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් - 2017 ..... 14
- වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනේ කාර්ය සාධනය - 2018 ..... 17
- යෝජිත වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන - 2019 ..... 18
- කලාපීය කාර්ය සාධනය ..... 19
    - කලාප 1 - ඉදිකිරීම් ..... 19
        - කාර්ය සාධනය ..... 19
        - සම්පූර්ණ කළ ව්‍යාපෘති ..... 19
    - කලාප 1 - නඩත්තු ..... 20
        - කාර්ය සාධනය ..... 20
        - සම්පූර්ණ කළ ව්‍යාපෘති ..... 20
    - කලාප 2 ..... 21
        - කාර්ය සාධනය ..... 21
        - සම්පූර්ණ කළ ව්‍යාපෘති ..... 21
    - කලාප 3 ..... 22
        - කාර්ය සාධනය ..... 22

- සම්පූර්ණ කළ ව්‍යාපෘති 22
- කලාප 4 23
  - කාර්ය සාධනය 23
  - සම්පූර්ණ කළ ව්‍යාපෘති 23
- කලාප 5 24
  - කාර්ය සාධනය 24
  - සම්පූර්ණ කළ ව්‍යාපෘති 24
- කලාප 6 25
  - කාර්ය සාධනය 25
  - සම්පූර්ණ කළ ව්‍යාපෘති 25
- මානව සම්පත් 26
- මානව සම්පත්-ශක්තිය 27
  - සේවක සංඛ්‍යාව 27
  - ධාරිතා සංවර්ධනය: 29
- අභ්‍යන්තර විගණක වාර්තාව 32
  - අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන පරමාර්ථය 32
- විගණකාධිපති වාර්ථාව 34

## හැඳින්වීම

රාජ්‍ය වැඩ දෙපාර්තමේන්තුව (PWD) යටතේ ක්‍රියාත්මක වූ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව 1969 දී ස්ථාපිත කරන ලද අතර දශක 5 ක පමණ කාලයක් පුරා ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වගකියනු ලබන ස්වාධීන ආයතනයක් ලෙස පවතී. මෙම දෙපාර්තමේන්තුව ගොඩනැගිලි සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් කටයුතු ක්ෂේත්‍රය තුළ පූර්ණ අධිකාරිය සහ උපදේශක ආයතනය වෙයි. ගොඩනැගීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී සහ එම වැඩසටහන් සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ගයන් සම්බන්ධව කටයුතු කිරීමේදී විශේෂඥ උපදෙස් ගැනීම පිණිස ද එය කැඳවීම කරනු ලබයි.

දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරීත්වය, මූල්‍ය රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛ සහ ගැසට් නිවේදනය තුළ දක්වා ඇත. ජාතික සංවර්ධනය තුළ සහ රාජ්‍ය ගොඩනැගිලි වත්කම් සංරක්ෂණයේදී දෙපාර්තමේන්තුව අනභිභවනීය කාර්ය භාරයක් ඉටු කරනු ලබයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වෙනි සංශෝධනයේ දී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහ ගත කෙරිණි. ශ්‍රී ලංකාවේ රජයේ ගොඩනැගිලි සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ වගකීම සම්බන්ධව අධිකාරිය සහ වගකීම ඇත්තේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවටයි. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ISO 9001:2008 තත්ව සහතිකය ද ලබා ඇත. ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික වගවීම වෙත විශේෂ අවධානයක් යෙදවීම තුළින් දෙපාර්තමේන්තුව තම වගකීම ප්‍රති අර්ථ කථනය කරයි.

## සංස්ථානික තොරතුරු

| | | |
|---|---|---|
| **නම** | - | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව |
| **නෛතික තත්ත්වය** | - | පූර්ණ රාජ්‍ය ආයතනයකි |
| **අමාත්‍යාංශය** | - | නිවාස , ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු |
| **කාර්යාලය** | - | දෙවන මහල<br>“සෙත්සිරිපාය”, බත්තරමුල්ල<br>ශ්‍රී ලංකාව<br>දුර. 94 11 2862588 ෆැක්ස්. 94 11 2864771<br>විද්‍යුත් තැපැල dgb@buildingsdept.gov.lk<br>අන්තර්ජාල ලිපිනය www.buildingsdept.gov.lk |




*රූපය 1: ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටීම*

## දැක්ම

ජනතාවට විශිෂ්ඨ සේවාවක් ලබාදීම පිණිස සුරක්ෂිත වූද, පිරිමැසුම් දායක වූද, තිරසාර හා විශිෂ්ඨ ලෙස නිමවූ ගොඩනැගිලි පරිසරයක් රාජ්‍ය අංශ ආයතන වලට ලබා දෙමින් ගොඩනැගිලි තාක්‍ෂණයේ ප්‍රමුඛයා බවට පත්වීම.

## මෙහෙවර

තාක්‍ෂණික වගකීම, ගුණාත්මක භාවය, පිරිමැසුම්දායක බව, අපේක්‍ෂිත ගුණාංග හා තිරසාර බව සාක්ෂාත් කරමින් තම සේවා දායකයින් පූර්ණ තෘප්තියට පත් කිරීම උදෙසා විවිධ වෘත්තීන්හි නිපුණ, එසේම තත් කාර්යයන් සඳහා ඇප කැපවූ වෘත්තිකයන් පිරිසක් විසින් වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරුමය නිර්මාණ ද ඉදිකිරීම්, නඩත්තු කිරීම්, ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්‍ෂණික උපදෙස් සැපයීම මඟින් රාජ්‍ය අංශයේ ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යයන් වැඩි දියුණු කිරීම වස් විශිෂ්ඨ සේවාවක් සැපයීම.

## තත්ව ප්‍රතිපත්තිය

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, රාජ්‍ය අංශයේ ගොඩනැගිලි වැඩි දියුණු කිරීම සඳහා විශිෂ්ඨ සේවයක් සැපයීමට වගකීව යුතු මූලික රාජ්‍ය ආයතනය ලෙස;

- සේවාදායක අවශ්‍යතාවය සපුරමින් ඔවුන් තෘප්තිමත් කිරීම.
- ව්‍යවස්ථාපිත, නියාමන අවශ්‍යතාවයන් සහ අදාල සම්මතයන්ට අනුගත වීම.
- පසුවිපරම් කිරීම, ප්‍රතිපෝෂණයන් හා දැනුම් හැකියාව යාවත්කාලීන කිරීම තුලින් අපගේ සේවා සැපයීම වැඩිදියුණු කිරීමෙහිලා නිරන්තර යොමු කිරීම.
- විවිධ ක්ෂේත්‍රයන්ට අයත් වෘත්තිකයන්ගේ ගැලපීම තුලින් සම්පූර්ණ දායකත්වය ලබාදීම.
- ISO 9001:2008 තත්ව කළමනාකරණ ක්‍රමවේදයේ අවශ්‍යතාවයන්ට අනුකූල වීම හා එය නිරන්තරව වැඩිදියුණු කිරීම.

.

## අධිකාරිය සහ වගකීම

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට මූල්‍ය රෙගුලාසි අංක 787, 788, 789 සහ 790 යටතේ බලතල පැවරී ඇත. ඒ අනුව, තාක්ෂණික නොවන දෙපාර්තමේන්තු සහ වෙනත් ආයතන සඳහා දෙපාර්තමේන්තුව පහත වගකීම් දරයි.

1. රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ආයතන වල වැය ශීර්ෂය තුළ සපයා ඇති මූල්‍ය ප්‍රතිපාදන අනුව ගොඩනැගිලි සැලසුම් කිරීම, ඇස්තමේන්තු සෑදීම, ඉදිකිරීම් සහ අදාළ පහසුකම් සැපයීම.
2. ගොඩනැගීම් සඳහා උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවාවන් සැපයීම.
3. රජයේ ගොඩනැගිලිවල නඩත්තුව, අලුතින් එක් කිරීම් සහ වැඩි දියුණු කිරීම
4. රජයේ රෝහල්වල පල්දෝරු පද්ධති මෙහෙයුම හා නඩත්තුව හා එහි මනා ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම.
5. රජයේ නිවාසවල නඩත්තුව සහ මෙහෙයුම් කටයුතු
6. දෙපාර්තමේන්තුව මගින් සිදු කරන සියලු ගොඩනැගීම් කටයුතුවල තාක්ෂණික වගවීම තහවුරු කිරීම.
7. විදේශ දූත ව්‍යාපෘති.
8. බද්ධ නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන) පිළිබඳ 2018.05.25 දිනැති ගැසට් පත්‍රය අනුව සභාධිපත්‍ය දේපළ පදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික ලබා දීම.

අපගේ බැඳියාවන් සමග වඩාත් අනුගත වීම පිණිස දෙපාර්තමේන්තුව අවබෝධතා ගිවිසුමක් මගින් එකඟතාවයකට පැමිණ සේවාවන් සපයනු ලැබේ.

## දෙපාර්තමේන්තුවේ සහතිකය

සේවාදායකයාගේ තාක්ෂණික සහ කළමනාකරණ ධාරිතාව සලකා බලමින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සක්‍රිය සහයක් ලබාදෙනු ලැබේ. ඉදිකිරීම් සඳහා සහතිකයක් ලබාදීමට ඇති අවශ්‍යතාවය අපි අගය කරන අතර පහත ක්‍රියාමාර්ග තුළින් අවදානම අඩු කරගැනීමට වගකියන්නෙමු:

a. යාවජීව තාක්ෂණික/මූල්‍ය වගවීම
b. සම්පූර්ණ ගොඩනැගිල්ල සඳහා බලයලත් ඉහළම වෘත්තිකයන් වෙතින් සැලසුම්
c. සියලුම රීති,රෙගුලාසි සහ තත්ව හා ආරක්ෂක ප්‍රමිතීන් අනුගමනය කිරීම
d. අතීත අත්දැකීම් භාවිතා කරමින් විශේෂයෙන් සංවර්ධනය කළ අති නිරවද්‍ය විෂය පථය
e. අනෙකුත් සේවා සපයන්නන්ගේ සැලසුම්, ලේඛන යනාදිය පරීක්ෂා කර තත්ත්වය සහ ආරක්ෂාව තහවුරු කිරීම
f. කොන්ත්‍රාත් කළමනාකරණය කිරීම
g. අත්දැකීම්ලත් වෘත්තීය ව්‍යාපෘති කළමනාකරණ සේවය මගින් වටිනාකම් කර දීම
h. කළමනාකරණ විගණනවල මතුවන ගැටළුවලදී සහය ලබාදීම
i. ගිවිසුම්ගත නීතිමය කටයුතුවලදී සහය ලබාදීම
j. තාක්ෂණික ඇගයීම් සහ ප්‍රසම්පාදන කමිටුවලට සහභාගී වී තාක්ෂණික සහය ලබාදීම

## කළමනාකාරීත්ව ධූරාවලිය

| | | |
|---|---|---|
| ඉංජි.එම්.එච්.එම්.ඉස්මයිල් | - | අධ්‍යක්ෂ ජනරාල් |
| ඉංජි කේ.ජී. සන්ධ්‍යා කුමුදිනී මහත්මිය | - | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු සේවා) |
| (පුරප්පාඩු) | - | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (උපදේශක සේවා) |
| එස්.ඩී.ඩී.පී. සිංහපුර මහත්මිය | - | අධ්‍යක්ෂ (පාලන) |
| ටී.සී. මහානාම මහත්මිය | - | ප්‍රධාන ගණකාධිකාරී |
| ඉංජි ඩබ්ලිව්.ඒ.ඩබ්ලිව්. අබයවර්ධන මහත්මිය | - | අධ්‍යක්ෂ (ඉදිකිරීම් - කලාප 1) |
| ඉංජි. ඒ. නවාස් ආදම් | - | අධ්‍යක්ෂ (ඉදිකිරීම් - කලාප 2) |
| ඉංජි කේ.ලියනගේ මහත්මිය | - | අධ්‍යක්ෂ (ඉදිකිරීම් - කලාප 3) |
| ඉංජි. ජී.එච්. හිරිමුතුගොඩ මහත්මිය | - | අධ්‍යක්ෂ (ඉංජිනේරු නිර්මාණ) |
| එස්. නරසිංහ මෙනවිය | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| වාස්තු විද්‍යාඥ කේ.බී. මේනක මංගලනාථ | - | වැඩ බලන අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා) |

## සපයන සේවාවන්

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සේවා දායකයන්ට තම අවශ්‍යතාවයන් සපුරා ගැනීමට හා තම ගොඩනැගිලි, යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සාක්ෂාත් කර ගැනීමේ ලා ඇති වෙන ධාරිතා පරතරය පිරවීමට කටයුතු කරයි.

**ව්‍යාපෘති යෝජනා** (මෙහි කාර්යය වන්නේ සේවාදායකයා හඳුනා ගත් ව්‍යාපෘති සඳහා පහසුකම් සැපයීමයි)

ව්‍යාපෘති අනුමැතීන් ලබාගැනීමට සහ මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට සහය වීම පිණිස සේවාදායකයන් සඳහා ව්‍යාපෘති සාරාංශ, සංභාව්‍යතා වාර්තා, පිරිවැය ඇස්තමේන්තු සහ තාක්ෂණික සහය ලබා දීම අපි සිදු කරන්නෙමු.

**කාර්ය නිෂ්පාදනය** (ව්‍යවසායක ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ කාර්යය)

සැලසුම් සැකසීම, සම්පූර්ණ කිරීම සහ ක්‍රියාත්මක කිරීම යන සියල්ල සඳහා අපි සම්පූර්ණ වගකීම භාර ගන්නෙමු. සේවාදායකයාට ඇත්තේ සිදුවිය යුතු සියල්ල සිදුවීමට අවශ්‍ය යතුර යෙදීම පමණි.

මූල්‍ය රෙගුලාසි වල දක්වා ඇති පරිදි, ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්වරයා නමට නිකුත් කෙරුණු වෙක් පතක් හෝ වැය ශීර්ෂයක් මාරු කිරීමෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට අරමුදල් නිකුත් කෙරේ.

**උපදේශනය** (ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ කාර්යය)

අප විසින් පූර්ව කොන්ත්‍රාත් වගකීම ලෙස ශක්‍යතා වාර්තා සැකසීම, සැලසුම් සකස් කිරීම, ප්‍රමාණ පත්‍ර සැකසීම සහ ලංසු ලේඛණකරණය කරනු ලබන අතර පශ්චාත් කොන්ත්‍රාත් වගකීම ලෙස ඉදිකිරීම් කළමනාකරණ සේවාවන් සපයනු ලැබේ. මෙහිදී ලංසු ක්‍රියාවලියේ වගකීම සේවාදායකයා විසින් ගනු ලැබේ.

අරමුදල් සේවාදායකයා අත රඳෙන අතර සේවාදායකයා විසින් ඉදිකිරීම් කටයුතු සඳහා ගෙවීම් කරනු ලැබේ.

**ව්‍යාපෘති කළමනාකරණය (ව්‍යවසායක ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ/උපදේශක ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ කාර්යය)**

කොන්ත්‍රාත් ආයතනය වෙත උපදේශනය සැපයීමේ වගකීම අප විසින් ගනු ලැබේ. මෙහිදී ක්‍රියාත්මක කිරීමට භාරගැනීම හෝ ඒ සඳහා සේවාදායකයාට උපදෙස් දීම සිදු කෙරේ. BOT (ඉදිකිරීම, මෙහෙයවීම හා පැවරීම), BOOT (ඉදිකිරීම, හිමිකරගැනීම, මෙහෙයවීම සහ පැවරීම) යටතේ පුද්ගලික අංශයේ ආයෝජන වැඩසටහන් සහ රජයේ හෝ ප්‍රදායක නියෝජිතායතනවල සැළසුම් සහ ගොඩනැගීම් කොන්ත්‍රාත් අප විසින් භාරගනු ලැබේ.

මෙය මඟින් අරමුදල් සේවාදායකයා අත රඳෙන අතර සේවාදායකයා විසින් ඉදිකිරීම් කටයුතු සඳහා ගෙවීම් කරනු ලැබේ.

**නඩත්තුව, විශේෂ අලුත්වැඩියා, වැඩිදියුණු කිරීම් (කාර්ය භාරය වනුයේ සේවාදායකයාට පහසුකම් සැපයීමයි)**

තත්ව වාර්තා සැකසීම, නඩත්තු කාර්ය සංග්‍රහයන් සැකසීම, නඩත්තු ඇස්තමේන්තු සැකසීම, නඩත්තු ක්‍රියාත්මක කිරීම, ගොඩනැගිලි යටිතල පහසුකම් ප්‍රතිස්ථාපනය කිරීමට භාරගනු ලැබේ.

සිදු කෙරෙන කටයුතු සඳහා අරමුදල් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට නිදහස් කළ යුතුය

**ලබාදෙන වෙනත් සේවාවන්.**

අනෙක් ආයතනවල තාක්ෂණික ඇගයීම් කමිටුවල සාමාජිකයින් ලෙස සමර්ථ නිලධාරීන් පත්කර ඒ සඳහා සහභාගී වෙනු ලැබේ.

## කලාප කාර්යාල




*රූපය 2: කලාප බෙදීමේ සිතියම*

**"ගොඩනැගිලි දෙපාර්තමේන්තුව දීපව්‍යාප්ත ස්ථාන 6ක පිහිටි කලාප කාර්යාල හතක් හරහා සේවාදායකයින්ට සේවාවන් ලබාදෙයි."**

# අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රකාශය

**ජාතික සංවර්ධනයට දායකත්වය**

අප දෙපාර්තමේන්තුව ඉදිකිරීම් අංශය තුළින් සම්පූර්ණ වශයෙන්ම රටේ සංවර්ධන කටයුතු වලට දායකත්වය සපයමින් දීප ව්‍යාප්ත ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති කළමනාකරණ සේවාවන් ලබාදීමට දෙපාර්තමේන්තුවට සමත්විය.

**ISO 9001:2008 තත්ව සහතිකය ලබා ගැනීම**

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය සහ ප්‍රධාන ඉංජිනේරු (කලාප 5) කාර්යාලය ISO 9001:2008 ක්‍රියාත්මක කරනු ලබයි.

අනෙකුත් කලාප කාර්යාල ද ISO තත්වය ලබා ගැනීම සඳහා අදාළ ලේඛන සූදානම් කර ගෙන යයි.

**ප්‍රගති සාරාංශය**

2018 වසර තුළ ඉලක්කගත අගයට සාපේක්ෂව මූල්‍ය ප්‍රගතියේ ප්‍රතිශතය 76% කි

**2018 වසර තුළ මුහුණ දුන් බාධකයන්**

- කාර්ය මණ්ඩලයේ හිඟකම
  - ඉංජිනේරුවන් සහ වාස්තු විද්‍යාඥයින්
  - කාර්මික නිලධාරීන් සහ සැලසුම් ශිල්පීන්
  - තාක්ෂණ සහායකයින්
  - රාජ්‍ය කළමනාකරණ සහකාර සහ සංවර්ධන නිලධාරි
  - රියදුරන්
- පහසුකම් සහ ප්‍රතිලාභ මඳ හෙයින් රජයේ සේවය තුළ නිලධාරීන් රඳවා ගැනීමේ අපහසුකම
- වැඩ බිම් වෙත යාම සඳහා වාහන අඩුකම
- හදිසි ව්‍යාපෘති සඳහා පැවරුම් කිරීමේ පදනම මත උපදේශක සේවා ලබා ගැනීමේ අනුමැති නොමැති වීම
- සංචාරක බංගලා නඩත්තුව/නඟාලීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම
- අත්හිටවූ ව්‍යාපෘති සඳහා ගෙවීම් නොකිරීම (සැලසුම් සම්පූර්ණ කිරීමෙන් පසු)
- ඉදිකිරීම් අදියර තුළ සේවාදායකයන් විසින් කරනු ලබන වෙනස් කිරීම් නිසා ව්‍යාපෘති ප්‍රමාද වීම
- කොන්ත්‍රාත්කරුවන්ගේ සම්පත් මඳකම නිසා හා ප්‍රතිපාදන නොමැතිවීම මත කලට වේලාවට ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේ අසීරුතාව
- සේවාදායකයින් විසින් ව්‍යාපෘති අනුමත කිරීමේ හා පළාත් පාලන අනුමැතීන් ලබාගැනීමේ ප්‍රමාදයන්

**ඉංජි. එම්.එච්.එම්.ඉස්මයිල්**
ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්

## 2018 දක්වා අතීත කාර්ය සාධනය




| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2018 Progress | 317.52 | 633.96 | 1025.74 | 1486.19 | 1848.77 | 2234.20 | 2698.55 | 3232.35 | 3624.22 | 4055.74 | 4531.04 | 5333.34 |
| 2018 Target | 793.92 | 1687.69 | 2621.06 | 2187.60 | 3072.45 | 3907.94 | 3708.59 | 4140.36 | 5072.30 | 4779.27 | 5880.11 | 7035.31 |

රූපය 3: පසුගිය වසරවල් සමග ඉදිකිරීම් සන්සන්දනය




| | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|---|---|---|
| Rehabilitation | 212.92 | 206.90 | 142.09 | 158.08 | 344.80 | 363.13 | 603.43 | 502.77 | 446.62 |
| New Buildings | 303.5 | 426.05 | 479.03 | 1181.14 | 1178.21 | 1940.68 | 3313.95 | 4759.63 | 4886.74 |
| Total | 516.42 | 632.95 | 621.12 | 1339.22 | 1523.01 | 2303.81 | 3917.38 | 5262.40 | 5333.36 |

*රූපය 4: පසුගිය සත් වසර සමග සන්සන්දනය*

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රජයේ ආයතනවල සේවාදායකයින්ට සේවාවන් සපයනු ලබයි. දෙපාර්තමේන්තුව වෙතින් සපයන ප්‍රධාන සේවාවන් නම, නව ගොඩනැගිලි සහ යටිතල පහසුකම් ඉදිකිරීම, ප්‍රතිසංස්කරණය ලෙස වර්ගීකරණය කළ හැකිය. රූපය 4 මගින් පෙන්වා දී ඇති පරිදි දෙපාර්තමේන්තුව 2010 වසරේ වූ මිලියන 516 ක කාර්ය සාධනයේ සිට 2018 මිලියන 5333 දක්වා වර්ධනය වී ඇති අතර එය 933% වැඩි වීම. 2010 වසරේ සිට 2018 දක්වා වාර්ෂික වර්ධනය 1 වගුවේ සහ 4 රූපයේ දක්වා ඇත.

*වගුව 1: 2010-2018දක්වා වාර්ෂික වර්ධනය*

| වසර | වාර්ෂික කාර්ය සාධනය (රුපියල් මිලියන) | වර්ධනය % (පදනම් වර්ෂය 2010) | වර්ධනය % (පදනම් වර්ෂය පෙර වසර) |
|---|---|---|---|
| **2010** | 516.42 | | |
| **2011** | 632.95 | 23% | 23% |
| **2012** | 621.12 | 20% | -2% |
| **2013** | 1339.22 | 159% | 115% |
| **2014** | 1523.01 | 195% | 14% |
| **2015** | 2303.81 | 346% | 51% |
| **2016** | 3917.38 | 659% | 70% |
| **2017** | 5262.40 | 919% | 34% |
| **2018** | 5333.35 | 933% | 1% |




*රූපය 5: කාර්ය සාධනයේ වර්ධනය*

වගුව 2 මගින් දක්වා ඇති පරිදි 2017 සිට 2018 දක්වා දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය මිලියන 5262 සිට 5333 දක්වා වර්ධනය වී ඇත. පහත වගුව 2 මගින් ප්‍රතිසංස්කරණය සහ නව ගොඩනැගිලි යන ක්ෂේත්‍රවල කාර්ය සාධනය පෙන්වයි. 2017 සිට 2018 දක්වා කාලය තුළ නව ගොඩනැගීම් 3% කින් වර්ධනය වී ඇති අතර ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති 11% කින් අඩු වී ඇත.

*වගුව 2: වාර්ෂික කාර්ය සාධනයේ ආංශික සංසන්දනය*

| අංශය | වාර්ෂික කාර්ය සාධනය රුපියල් ( මිලියන) | | වර්ධන ප්‍රතිශතය |
|---|---|---|---|
| | 2017 | 2018 | |
| ප්‍රතිසංස්කරණය | 502.77 | 446.62 | -11% |
| නව ගොඩනැගිලි | 4759.63 | 4886.74 | 3% |
| එකතුව | **5262.40** | **5333.35** | **1%** |

## 2018 වසරේ ව්‍යාපෘති වල සාරාංශය

වගුව 3 මගින් දක්වා ඇති පරිදි 2018 වසරේදී දෙපාර්තමේන්තුව ව්‍යාපෘති 389 ක් සිදුකළ අතර ව්‍යාපෘති අගය රුපියල් මිලියන 25ට අඩු ව්‍යාපෘතීන් 239ක් ද, ව්‍යාපෘති අගය රුපියල් මිලියන 25 සහ රුපියල් මිලියන 100 අතර වන ව්‍යාපෘතීන් 85ක් ද, අගය රුපියල් මිලියන 100 සහ 200 අතර වන ව්‍යාපෘතීන් 40ක්ද, ව්‍යාපෘති අගය රුපියල් මිලියන 200 කට වැඩි ව්‍යාපෘතීන් 25ක්ද විය

*වගුව 3: 2018 වසරේ ඉදිකිරීම් අංශයේ සාරාංශය*

| කලාප කාර්යාලය | ව්‍යාපෘති වටිනාකම රුපියල් (මිලියන) | | | | |
|---|---|---|---|---|---|
| | **0-25** | **25-100** | **100-200** | **>200** | **එකතුව** |
| කලාප 1 - ඉදිකිරීම් | 13 | 6 | 5 | 6 | 30 |
| කලාප 1 - නඩත්තුව | 66 | 8 | 3 | 1 | 78 |
| කලාප 2 | 16 | 14 | 2 | 3 | 35 |
| කලාප 3 | 21 | 14 | 12 | 2 | 49 |
| කලාප 4 | 61 | 18 | 4 | 7 | 90 |
| කලාප 5 | 14 | 12 | 10 | 3 | 39 |
| කලාප 6 | 48 | 13 | 4 | 3 | 68 |
| **එකතුව** | **239** | **85** | **40** | **25** | **389** |

## උපදේශක අංශයේ කාර්ය සාධනය

දෙපාර්තමේන්තුව විසින් සපයන සේවාවන්ගේ අරටුව වනුයේ උපදේශන අංශයයි. මෙම අංශය විසින් ඉදිකිරීම් සහ අදාළ යටිතල පහසුකම් සඳහා වාස්තු විද්‍යාත්මක, ව්‍යුහාත්මක, විද්‍යුත්, ජල සැපයුම්, ජලාපවාහන සහ යාන්ත්‍රික නිමැවුම් යනාදී ආකාර වලින් සේවාවන් සහ ප්‍රමාණ පත්‍ර ද සැකසීම ද වේ. ඉහත සේවාවන් සපයනුයේ ඒ සඳහා කැපවූ වෘත්තීමය වාස්තු විද්‍යාඥයන් සහ ඉංජිනේරුවරුන් විසිනි. මෙම අංශය 2013 වසරේ රුපියල් මිලියන 2700 ක කාර්ය සාධනයක් පෙන්වූ අතර 2014 දී එය රුපියල් මිලියන 3308 ක්ද 2015 වසරේදී රුපියල් මිලියන 4342 ක්ද 2016 වසරේදී රුපියල් මිලියන 7236 ක්ද, 2017 වසරේදී රුපියල් මිලියන 6646 ක්ද, 2018 වසරේදී රුපියල් මිලියන 3750 ක්ද දක්වා විය. පහත 4 වගුව 2018 වසරේ ව්‍යාපෘති ප්‍රමාණය පෙන්වන අතර 2013 සිට 2018 දක්වා කාර්ය සාධනය 6 වන රූපය මගින් නිරූපනය කෙරේ.

*වගුව 4: 2018 වසරේදී ව්‍යාපෘති උපදේශන අංශයේ සාරාංශය*

| අංකය | විස්තරය | ව්‍යාපෘති ගණන |
|---|---|---|
| 1 | සැලසුම් අදියරේදී සම්පූර්ණ කළ ව්‍යාපෘති | 45 |
| 2 | සේවාදායක අනුමැතීන් සඳහා වන දළ සැලසුම් | 103 |
| 3 | ඉදිකිරීම් අදියර සඳහා සැළසුම් සකස් කරන ව්‍යාපෘති | 14 |
| 4 | 2017 වසර අවසානයේ සැකසෙමින් ඇති දළ සැලසුම් | 01 |
| 5 | 2017 වසර අවසානයේ විමර්ශන අදියරේ පවතින ව්‍යාපෘති | 06 |
| | **මුළු ව්‍යාපෘති සංඛ්‍යාව** | **169** |
| | සැලසුම් අදියරේදී අවසන් කල ව්‍යාපෘති වල ඇස්තමේන්තු ගත මුළු වටිනාකම (රුපියල් මිලියන) | **3750** |




| | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|
| Target (Rs. Mn) | 0 | 3240 | 3900 | 6000 | 6500 | 6600 |
| Progress (Rs. Mn) | 2700 | 3308 | 4342 | 7236 | 6646 | 3750 |

*රූපය 6: උපදේශන අංශයේ කාර්ය සාධනයේ ප්‍රස්තාරමය නිරූපනය කිරීම*

## අත්තිකාරම් ගිණුමේ දක්වා ඇති සීමාවන්ගේ සත්‍ය ප්‍රකාශනය - 2018




| | Max limit of Expenditure | Min limit of Receipts | Max limit of Debit balance |
|---|---|---|---|
| Estimate Limits Rs.(Mn) | 26.00 | 14.00 | 90.00 |
| Received Limits Rs.(Mn) | 26.00 | 14.00 | 90.00 |
| Actual Expenditure /Receipts Rs.(Mn) | 25.990 | 17.500 | 66.160 |

*රූපය 7: අත්තිකාරම් ගිණුමේ දක්වා ඇති සීමාවන්ගේ සත්‍ය ප්‍රස්තාරමය ඉදිරිපත් කිරීම*

## ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් - 2017




| | Capital Budget | Recurrent Budget | Total |
|---|---|---|---|
| Annual estimate (Rs.Mn) | 91.5 | 325.95 | 417.45 |
| Supplementary Provision (Rs.Mn) | 0 | 29.40 | 29.40 |
| Total (Rs.Mn) | 91.50 | 355.35 | 446.85 |
| Expenditure(Rs.Mn) | 75.49 | 354.62 | 430.12 |

*රූපය 8: ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම්වල ප්‍රස්තාරමය ඉදිරිපත් කිරීම*

වගුව 5: පුනරාවර්තන වියදමේ සාරාංශය

| වැය විෂය | අයිතමයේ විස්තරය | 2018 ඇස්තමේන්තුවේ ප්‍රතිපාදනය | වියදම | ශේෂය | වියදමේ % |
|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | | | | | |
| | **පුද්ගල පඩිනඩි** | | | | |
| 1001 | වැටුප් සහ වේතන<br>අතිකාල සහ නිවාඩු දින ගෙවීම් | 166,817,000.00 | 166,620,264.61 | 196,735.39 | 99.88 |
| 1002 | වෙනත් දීමනා | 9,976,000.00 | 9,972,860.00 | 3,140.00 | 99.97 |
| 1003 | එකතුව | 80,583,000.00 | 80,578,813.22 | 4,186.78 | 99.99 |
| | **පුද්ගල පඩිනඩි** | **257,376,000.00** | **257,171,937.83** | **204,062.17** | **99.92** |
| | **ප්‍රවාහන දීමනා** | | - | - | |
| 1101 | දේශීය | 8,045,000.00 | 8,041,769.02 | 3,230.98 | 99.96 |
| 1102 | විදේශීය | 1,100,000.00 | 1,099,903.54 | 96.46 | 99.99 |
| | **එකතුව** | **9,145,000.00** | **9,141,672.56** | **3,327.44** | **99.96** |
| | **සැපයුම්** | | - | - | |
| 1201 | ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 5,917,000.00 | 5,906,825.45 | 10,174.55 | 99.83 |
| 1202 | ඉන්ධන | 11,440,000.00 | 11,426,048.02 | 13,951.98 | 99.88 |
| 1203 | ආහාර සහ නිල ඇඳුම් | 534,000.00 | 531,080.00 | 2,920.00 | 99.45 |
| | **එකතුව** | **17,891,000.00** | **17,863,953.47** | **27,046.53** | **99.85** |
| | **නඩත්තු වියදම්** | | - | - | |
| 1301 | වාහන | 7,700,000.00 | 7,579,494.46 | 120,505.54 | 98.43 |
| 1302 | අංගන, පිරියත හා උපකරණ | 3,800,000.00 | 3,716,859.86 | 83,140.14 | 97.81 |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 500,000.00 | 479,487.38 | 20,512.62 | 95.90 |
| | **එකතුව** | **12,000,000.00** | **11,775,841.70** | **224,158.30** | **98.13** |
| | **ඉදිකිරීම් සේවාවන්** | | - | - | |
| 1401 | ප්‍රවාහන | 7,900,000.00 | 7,895,063.00 | 4,937.00 | 99.94 |
| 1402 | තැපැල් සහ සන්නිවේදන | 5,890,000.00 | 5,830,983.24 | 59,016.76 | 99.00 |
| 1403 | විදුලිය සහ ජලය | 3,100,000.00 | 3,093,384.62 | 6,615.38 | 99.79 |
| 1404 | කුලී සහ දේශීය බදු | 38,425,000.00 | 38,250,558.52 | 174,441.48 | 99.55 |
| 1409 | වෙනත් | 1,560,000.00 | 1,546,924.01 | 13,075.99 | 99.16 |
| | **එකතුව** | **56,875,000.00** | **56,616,913.39** | **258,086.61** | **99.55** |
| | **මාරු කිරීම්** | | - | - | |
| 1506 | රාජ්‍ය සේවකයන්ගේ දේපළ ණය පොළී | 1,880,000.00 | 1,879,292.96 | 707.04 | 99.96 |
| | **එකතුව** | **1,880,000.00** | **1,879,292.96** | **707.04** | **99.96** |

| වැය විෂය | අයිතමයේ විස්තරය | 2018 ඇස්තමේන්තුවේ ප්‍රතිපාදනය | වියදම | ශේෂය | වියදමේ % |
|---|---|---|---|---|---|
| | **වෙනත් පුනරාවර්තන වියදම්** | | - | - | |
| 1703 | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 183,000.00 | 177,508.25 | 5491.75 | 97.00 |
| | **එකතුව** | **183,000.00** | **177,508.25** | **5,491.75** | **97.00** |
| | **මුළු පුනරාවර්තන වියදම්** | **355,350,000.00** | **354,627,120.16** | **722,879.84** | **99.80** |

*වගුව 6: ප්‍රාග්ධන වියදම්*

| වැය විෂය | වැය විෂය | අයිතමයේ විස්තරය | 2018 ඇස්තමේන්තුවේ ප්‍රතිපාදනය | වියදම | ශේෂය |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන වියදම් | | | - | - | |
| | **ප්‍රාග්ධන වත්කම් ප්‍රතිසංස්කරණය සහ වැඩි දියුණු කිරීම** | | - | - | |
| 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 40,500,000.00 | 40,491,162.86 | 8,837.14 | 99.98 |
| 2002 | අංගන, පිරියත හා උපකරණ | 2,100,000.00 | 1,840,343.50 | 259,656.50 | 87.64 |
| 2003 | වාහන | 2,700,000.00 | 2,125,457.25 | 574,542.75 | 78.72 |
| | **එකතුව** | **45,300,000.00** | **44,456,963.61** | **843,036.39** | **98.14** |
| | **ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීම** | | - | - | |
| 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 2,277,000.00 | 2,199,812.02 | 77,187.98 | 96.61 |
| 2103 | අංගන පිරියත සහ උපකරණ | 20,156,500.00 | 9,091,977.78 | 11,064,522.22 | 45.11 |
| 2104 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1,325,000.00 | 1,324,550.00 | 450.00 | 99.97 |
| 2105 | Land and Land Improvement | 15,623,000.00 | 15,604,055.02 | 18,944.98 | 99.88 |
| | **එකතුව** | **39,381,500.00** | **28,220,394.82** | **11,161,105.18** | **71.66** |
| | **මානව සම්පත් සංවර්ධනය** | | - | - | |
| 2401 | දැනුම වැඩි දියුණු කිරීම සහ ආයතනික සංවර්ධනය | 1,818,500.00 | 1,817,471.31 | 1,028.69 | 99.94 |
| | **එකතුව** | **1,818,500.00** | **1,817,471.31** | **1,028.69** | **99.94** |
| 2507 | **පර්යේෂණ හා සංවර්ධන** | 5,000,000.00 | 999,190.00 | 4,000,810.00 | 19.98 |
| | **එකතුව** | **5,000,000.00** | **999,190.00** | **4,000,810.00** | **19.98** |
| | **මුළු ප්‍රාග්ධන වියදම්** | **91,500,000.00** | **75,494,019.74** | **16,005,980.26** | **82.51** |
| | **මුළු ව්‍යාපෘති වියදම** | **446,850,000.00** | **430,121,139.90** | **16,728,860.10** | **96.26** |

## වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනේ කාර්ය සාධනය - 2018

*වගුව: 7 කාර්ය සාධනය*

| | | කාර්ය නිෂ්ඨාව | | උපදේශනය | | ව්‍යාපෘති කළමනාකරණය | | නඩත්තුව | | වැඩි දියුණු කිරීම | | ප්‍රතිසංස්කරණය | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මූල්‍ය (රුපියල් මිලියන) | භෞතික % | මූල්‍ය (රුපියල් මිලියන) | භෞතික % | මූල්‍ය (රුපියල් මිලියන) | භෞතික % | මූල්‍ය (රුපියල් මිලියන) | භෞතික % | මූල්‍ය (රුපියල් මිලියන) | භෞතික % | මූල්‍ය (රුපියල් මිලියන) | භෞතික % | මූල්‍ය (රුපියල් මිලියන) | භෞතික % |
| කලාප 1 - ඉදිකිරීම් | ඉලක්කය | 344.23 | 100 | 291.18 | 100 | 51 | 100 | - | - | - | - | - | - | **686.41** | **100** |
| | සත්‍ය | 256.42 | 48 | 212.69 | 55 | 17.2 | 26 | - | - | - | - | - | - | **486.31** | |
| කලාප 1 - නඩත්තුව | ඉලක්කය | - | - | 40.00 | 100 | 169.64 | 100 | - | - | 537.42 | 100 | - | - | **747.06** | **100** |
| | සත්‍ය | - | - | 39.00 | 98 | 158.50 | 86 | - | - | 378.77 | 66 | - | - | **576.27** | |
| කලාප 2 | ඉලක්කය | 501.41 | 100 | 227.89 | 100 | 398.78 | 100 | - | - | - | - | - | - | **1119.08** | **100** |
| | සත්‍ය | 420.23 | 84 | 208.87 | 87 | 336.05 | 86 | - | - | - | - | - | - | **965.15** | |
| කලාප 3 | ඉලක්කය | 477.70 | 100 | 981.50 | 100 | - | - | - | - | - | - | - | - | **1459.20** | **100** |
| | සත්‍ය | 353.94 | 73 | 456.30 | 46 | - | - | - | - | - | - | - | - | **810.24** | |
| කලාප 4 | ඉලක්කය | 408.61 | 100 | 898.75 | 100 | 47.74 | 100 | 4.52 | 100 | - | - | - | - | **1359.62** | **100** |
| | සත්‍ය | 432.48 | 88 | 750.83 | 79 | 34.35 | 70 | 4.96 | 100 | - | - | - | - | **1222.60** | |
| කලාප 5 | ඉලක්කය | 405.21 | 100 | 297.81 | 100 | 81.41 | 100 | 45.71 | 100 | - | - | - | - | **830.14** | **100** |
| | සත්‍ය | 394.17 | 97 | 240.44 | 81 | 81.41 | 100 | 45.32 | 99 | - | - | - | - | **761.34** | |
| කලාප 6 | ඉලක්කය | 211.51 | 100 | - | - | 605.21 | 100 | 17.08 | 100 | - | - | - | - | **833.80** | **100** |
| | සත්‍ය | 108.63 | 56 | - | - | 385.23 | 64 | 17.57 | 95 | - | - | - | - | **511.43** | |
| එකතුව | ඉලක්කය | **2274.07** | | **2707.07** | | **1339.30** | | **67.31** | | **537.42** | | **-** | | **7035.30** | |
| | සත්‍ය | **1883.10** | | **1903.14** | | **1007.26** | | **67.85** | | **378.77** | | **-** | | **5333.35** | |

## යෝජිත වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන - 2019

*වගුව 8: යෝජිත වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන 2019*

| | | කාර්ය නිෂ්පාදන | | උපදේශනය | | ව්‍යාපෘති කළමනාකරණය | | නඩත්තු | | වැඩි දියුණු කිරීම | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මූල්‍ය (රුපියල් මිලියන) | භෞතික % | මූල්‍ය (රුපියල් මිලියන) | භෞතික % | මූල්‍ය (රුපියල් මිලියන) | භෞතික % | මූල්‍ය (රුපියල් මිලියන) | භෞතික % | මූල්‍ය (රුපියල් මිලියන) | භෞතික % | මූල්‍ය (රුපියල් මිලියන) | භෞතික % |
| කලාප 1 - ඉදිකිරීම් | ඉලක්කය | 647.16 | 100 | 706.28 | 100 | 435.51 | 100 | - | - | - | - | 1788.95 | 100 |
| | සත්‍ය | | | | | | | | | | | | |
| කලාප 1 - නඩත්තුව | ඉලක්කය | - | - | 10.00 | 100 | 82.69 | 100 | - | - | 305.51 | 100 | 398.20 | 100 |
| | සත්‍ය | | | | | | | | | | | | |
| කලාප 2 | ඉලක්කය | 166.92 | 100 | 23.46 | 100 | 91.91 | 100 | - | - | - | - | 282.29 | 100 |
| | සත්‍ය | | | | | | | | | | | | |
| කලාප 3 | ඉලක්කය | 178.19 | 100 | 785.40 | 100 | - | - | - | - | - | - | 963.59 | 100 |
| | සත්‍ය | | | | | | | | | | | | |
| කලාප 4 | ඉලක්කය | 775.79 | 100 | 478.37 | 100 | 12.97 | 100 | - | - | - | - | 1267.14 | 100 |
| | සත්‍ය | | | | | | | | | | | | |
| කලාප 5 | ඉලක්කය | 561.61 | 100 | 694.06 | 100 | - | - | - | - | - | - | 1255.67 | 100 |
| | සත්‍ය | | | | | | | | | | | | |
| කලාප 6 | ඉලක්කය | 329.27 | 100 | - | - | 509.90 | 100 | 56.85 | 100 | - | - | 896.02 | 100 |
| | සත්‍ය | | | | | | | | | | | | |
| **එකතුව** | ඉලක්කය | **2658.95** | | **2697.57** | | **1132.98** | | **56.85** | | **305.51** | | **6851.86** | |
| | සත්‍ය | | | | | | | | | | | | |

## කලාපීය කාර්ය සාධනය

### කලාප 1 - ඉදිකිරීම්

| | |
|---|---|
| ප්‍රධාන ඉංජිනේරු | ඉංජි.ජී.එච්.ඒ.බී. සජෝත |
| නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු | ඉංජි.ජී.එච්.එන්.එන්. පෙරේරා |
| කාර්යාලය | ප්‍රධාන ඉංජිනේරු (කලාප 1 - ඉදිකිරීම්) කාර්යාලය , ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, අංක 213, ටොරින්ටන් අවන්‍යු, කොළඹ 07. |
| ☎ 94 11 554691 | ෆැක්ස් 94 11 2554690 |
| විද්‍යුත් තැපැල cecc@buildingsdept.gov.lk | |




### කාර්ය සාධනය

*වගුව 9: ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාප 1 - ඉදිකිරීම්) කාර්යාලයේ හි ප්‍රගතියේ සාරාංශය*

| | කාර්ය නිෂ්ධාව | උපදේශනය | එකතුව | කාර්ය නිෂ්ධාව |
|---|---|---|---|---|
| මූල්‍ය ඉලක්කය (රුපියල් මිලියන) | 344.23 | 291.18 | 51.00 | **686.41** |
| මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන) | 256.42 | 212.69 | 17.20 | **486.31** |
| සම්පූර්ණ කළ ව්‍යාපෘති (ගණන) | 4 | 4 | 0 | **8** |
| සිදු කෙරෙමින් ඇති ව්‍යාපෘති (ගණන) | 12 | 8 | 2 | **22** |

### සම්පූර්ණ කළ ව්‍යාපෘති

| **බත්තරමුල්ලේ ඉඩම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්ගේ නිළ නිවාසය ඉදිකිරීම** | | **ජා ඇල කපුවත්ත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් සඳහා ගරාජය හා විවේකාගාරය ඉදි කිරීම** | |
|---|---|---|---|
| ඇස්තමේන්තු ගත මුළු මුදල | රුපියල් මිලියන **24.08** | ඇස්තමේන්තු ගත මුළු මුදල | රුපියල් මිලියන **14.56** |
| සේවාදායකයා | ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව | සේවාදායකයා | ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් |
| |  | |  |

## කලාප 1 - නඩත්තු

| | |
|---|---|
| ප්‍රධාන ඉංජිනේරු | ඉංජි එම්. සත්‍යකුමාර් |
| නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු | ඉංජි. එස්. උමාකාන්ත් |
| කාර්යාලය | ප්‍රධාන ඉංජිනේරු (කලාප 1 - නඩත්තු) කාර්යාලය, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, 213 ටොරින්ටන් ඇවනියු කොළඹ 07 |
| ☎ 94 11 2582579 | ෆැක්ස් 94 11 2588686 |
| විද්‍යුත් තැපැල | cem@buildingsdept.gov.lk |




### කාර්ය සාධනය

*වගුව 10: ප්‍රධාන ඉංජිනේරු (කලාප 1- නඩත්තු) කාර්යාලයෙ හි නඩත්තු කටයුතු වල සාරාංශය*

| | උපදේශනය | ව්‍යාපෘති කළමනාකරණය | වැඩි දියුණු කිරීම් | එකතුව |
|---|---|---|---|---|
| මූල්‍ය ඉලක්කය (රුපියල් මිලියන) | 40.00 | 169.64 | 537.42 | **747.06** |
| මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන) | 39.00 | 158.50 | 378.77 | **576.27** |
| සම්පූර්ණ කළ ව්‍යාපෘති (ගණන) | 0 | 2 | 44 | **46** |
| සිදු කෙරෙමින් ඇති ව්‍යාපෘති (ගණන) | 1 | 1 | 18 | **20** |

### සම්පූර්ණ කළ ව්‍යාපෘති

| මරදාන එල්ෆින්ස්ටන් රඟහලේ , අළුත්වැඩියාව, පුනරුත්ථාපනය, ප්‍රකෘතිමත් කිරීම | | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ තුන් මහල් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම | |
|---|---|---|---|
| ඇස්තමේන්තු ගත මුළු මුදල | **390.00Mn** | ඇස්තමේන්තු ගත මුළු මුදල | **25.70Mn** |
| සේවාදායකයා | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | සේවාදායකයා | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |
| |  | |  |

## කලාප 2

| | | |
|---|---|---|
| ප්‍රධාන ඉංජිනේරු | ඉංජි. එස් විනෝදනී මහත්මිය |  |
| නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු | ඉංජි. කේ තිරුකුමාර් | |
| කාර්යාලය | ප්‍රධාන ඉංජිනේරු (කලාප 2) කාර්යාලය, ගොඩනැගිලිදෙපාර්තමේන්තුව, වෙරළ පාර,ගුරුනගර්, යාපනය. | |
| ☎ 94 21 2222781 | ෆැක්ස් 94 21 2222781 | |
| E mail. cej@buildingsdept.gov.lk | | |

## කාර්ය සාධනය

*වගුව 11: ප්‍රධාන ඉංජිනේරු (කලාප 2) කාර්යාලයෙ හි ප්‍රගතියේ සාරාංශය*

| | කාර්ය නිෂ්ඨාව | උපදේශනය | ව්‍යාපෘති කළමනාකරණය | එකතුව |
|---|---|---|---|---|
| මූල්‍ය ඉලක්කය (රුපියල් මිලියන) | 501.41 | 227.89 | 389.78 | **1119.08** |
| මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන) | 420.23 | 208.87 | 336.05 | **965.15** |
| සම්පූර්ණ කළ ව්‍යාපෘති (ගණන) | 11 | 7 | 2 | **20** |
| සිදු කෙරෙමින් ඇති ව්‍යාපෘති (ගණන) | 7 | 5 | 3 | **15** |

## සම්පූර්ණ කළ ව්‍යාපෘති

| යෝජිත වව්නියාවේ ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය - අදියර I | | වවුනියා කාර්මික විද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම | |
|---|---|---|---|
| ඇස්තමේන්තු ගත මුළු මුදල | 110.00 Mn. | ඇස්තමේන්තු ගත මුළු මුදල | 94.14 Mn. |
| සේවාදායකයා | *ජාතික යොවුන් සේනාංකය* | සේවාදායකයා | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය |
| |  | |  |

## කලාප 3

| | |
|---|---|
| ප්‍රධාන ඉංජිනේරු | ඉංජි. ජී.ආර්.එස්.බී. ගමලත් |
| නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු | ඉංජි.එස්. සුරේන්ද්‍රන් |
| කාර්යාලය | ප්‍රධාන ඉංජිනේරු (කලාප 3) කාර්යාලය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, විල්ගොඩ පාර, කුරුණෑගල |
| ☎ 94 37 2222197 | ෆැක්ස් 94 37 2222437 |
| විද්‍යුත් තැපැල | **cek@buildingsdept.gov.lk** |




## කාර්ය සාධනය

*වගුව 12: ප්‍රධාන ඉංජිනේරු (කලාප 3) කාර්යාලයෙ හි ප්‍රගතියේ සාරාංශය*

| | කාර්ය නිෂ්ඨාව | උපදේශනය | එකතුව |
|---|---|---|---|
| මූල්‍ය ඉලක්කය (රුපියල් මිලියන) | 477.70 | 981.50 | **1459.20** |
| මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන) | 353.94 | 456.30 | **810.24** |
| සම්පූර්ණ කළ ව්‍යාපෘති (ගණන) | 20 | 1 | **21** |
| සිදු කෙරෙමින් ඇති ව්‍යාපෘති (ගණන) | 20 | 9 | **29** |

## සම්පූර්ණ කළ ව්‍යාපෘති

| හලාවත , සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම | | මාතලේ කෘෂි අපනයන කාර්යාලයේ සඳහා ජාතික කුළුබඩු උද්‍යානයට තොරතුරු මධ්‍යස්ථානයක් ඉදි කිරීම | |
|---|---|---|---|
| ඇස්තමේන්තු ගත මුළු මුදල | 56.73Mn | ඇස්තමේන්තු ගත මුළු මුදල | 14.00Mn |
| සේවාදායකයා | සුරාබදු දෙපාර්තමේන්තුව | සේවාදායකයා | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| |  | |  |

## කලාප 4

| | |
|---|---|
| ප්‍රධාන ඉංජිනේරු | ඉංජි. කේ. ඉලන්කෝ |
| නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු | ඉංජි. එස්. තුෂාන්ති මහත්මිය |
| කාර්යාලය | ප්‍රධාන ඉංජිනේරු (කලාප 4) කාර්යාලය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, මන්මුනෙයි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මඩකලපුව |
| ☎ 94 63 2224490 | ෆැක්ස් 94 65 2229808 |
| විද්‍යුත් තැපැල. **ceu@buildingsdept.gov.lk** | |




### කාර්ය සාධනය

*වගුව 13: ප්‍රධාන ඉංජිනේරු (කලාප 4) කාර්යාලයෙ හි ප්‍රගතියේ සාරාංශය*

| | කාර්ය නිෂ්ඨාව | උපදේශනය | ව්‍යාපෘති කළමනාකරණය | නඩත්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| මූල්‍ය ඉලක්කය (රුපියල් මිලියන) | 408.60 | 898.75 | 47.74 | 4.52 | **1359.62** |
| මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන) | 432.48 | 750.83 | 34.35 | 4.96 | **1222.60** |
| සම්පූර්ණ කළ ව්‍යාපෘති (ගණන) | 45 | 12 | 5 | 5 | **67** |
| සිදු කෙරෙමින් ඇති ව්‍යාපෘති (ගණන) | 6 | 10 | 7 | - | **23** |

### සම්පූර්ණ කළ ව්‍යාපෘති

| **මැදිරිගිරියේ ජාතික යොවුන් සේනාංකය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම** | | **කල්ලඩි පොලිස් පුහුණු පාසල ප්‍රතිසංස්කරණය කිරීම** | |
|---|---|---|---|
| ඇස්තමේන්තු ගත මුළු මුදල | 100.00 Mn | ඇස්තමේන්තු ගත මුළු මුදල | 98.29 Mn |
| සේවාදායකයා | ජාතික යොවුන් සේනාංකය | සේවාදායකයා | පොලිස් දෙපාර්තමේන්තුව |
| |  | |  |

## කලාප 5

| | | |
|---|---|---|
| ප්‍රධාන ඉංජිනේරු | ඉංජි එන්.එම්.එම්. මරික්කාර් මහත්මිය |  |
| නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු | ඉංජි ඩී.සී. විජේසිංහ මහත්මිය | |
| කාර්යාලය | ප්‍රධාන ඉංජිනේරු (කලාප 5) කාර්යාලය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, මහනුවර | |
| ☎ 94 81223 4255 | ෆැක්ස් 94 81 2234255 | |
| විද්‍යුත් තැපැල | cec@buildingsdept.gov.lk | |



## කාර්ය සාධනය

*වගුව 14: ප්‍රධාන ඉංජිනේරු (කලාප 5) කාර්යාලයෙ හි ප්‍රගතියේ සාරාංශය*

| | කාර්ය නිෂ්ඨාව | උපදේශනය | ව්‍යාපෘති කළමනාකරණය | නඩත්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| මූල්‍ය ඉලක්කය (රුපියල් මිලියන) | 405.21 | 297.81 | 81.41 | 45.71 | **830.14** |
| මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන) | 394.17 | 240.44 | 81.41 | 45.32 | **761.34** |
| සම්පූර්ණ කළ ව්‍යාපෘති (ගණන) | 16 | 4 | 1 | 3 | **24** |
| සිදු කෙරෙමින් ඇති ව්‍යාපෘති (ගණන) | 4 | 10 | - | 1 | **15** |

## සම්පූර්ණ කළ ව්‍යාපෘති

| වැල්ලවායේ ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම | | සියඹලාණ්ඩුවේ ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම | |
|---|---|---|---|
| ඇස්තමේන්තු ගත මුළු මුදල | 202.5 Mn | ඇස්තමේන්තු ගත මුළු මුදල | 209.00 Mn |
| සේවාදායකයා | ජාතික යොවුන් සේනාංකය | සේවාදායකයා | ජාතික යොවුන් සේනාංකය |
| |  | |  |

## කලාප 6

| | | |
|---|---|---|
| ප්‍රධාන ඉංජිනේරු | ඉංජි කේ.පී.ඒ. ගුණවර්ධන |  |
| නියෝජ්‍ය<br>ප්‍රධාන ඉංජිනේරු | | |
| කාර්යාලය | ප්‍රධාන ඉංජිනේරු (කලාපය 6)<br>කාර්යාලය<br>ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,<br>අංක 10, ඉහළ ඩික්සන් පාර,<br>ගාල්ල. | |
| ☎ 94 91 223 4838 | ෆැක්ස් 94 91 223 4838 | |
| විද්‍යුත් තැපැල | ceg@buildingsdept.gov.lk | |

## කාර්ය සාධනය

*වගුව 15: ප්‍රධාන ඉංජිනේරු (කලාප 6) කාර්යාලයේ ප්‍රගතියේ සාරාංශය*

| | කාර්ය නිෂ්පාදන | ව්‍යාපෘති කළමනාකරණය | නඩත්තුව | එකතුව |
|---|---|---|---|---|
| මූල්‍ය ඉලක්කය (රුපියල් මිලියන) | 211.51 | 605.21 | 17.08 | **833.80** |
| මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන) | 108.63 | 385.23 | 17.57 | **511.43** |
| සම්පූර්ණ කළ ව්‍යාපෘති (ගණන) | 7 | 6 | 5 | **22** |
| සිදු කෙරෙමින් ඇති ව්‍යාපෘති (ගණන) | 8 | 26 | 1 | **87** |

## සම්පූර්ණ කළ ව්‍යාපෘති

| අහංගම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ හෝටල් පාසල ඉහල ශ්‍රේණියට නැංවීම | | බෙන්තොට 'සුලංකා' නිවාඩු බංගලාව අලුත්වැඩියා කිරීම - | |
|---|---|---|---|
| ඇස්තමේන්තු ගත මුළු මුදල | 153.30 Mn | ඇස්තමේන්තු ගත මුළු මුදල | 34.14 Mn |
| සේවාදායකයා | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය අහංගම | සේවාදායකයා | සංචාරක සංවර්ධන අධිකාරිය |
| |  | |  |

## මානව සම්පත්

*වගුව 16: 31.12.2018 දිනට සේවක සංඛ්‍යා විස්තර*

| කළමනාකරණ කාර්ය මණ්ඩලය | අනුමත | පවතින | පුරප්පාඩු | මෙහෙයුම් කාර්ය මණ්ඩලය | අනුමත | පවතින | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 0 | ජ්‍යෙෂ්ඨ වාස්තු විද්‍යාඥ | 2 | 0 | 2 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු සේවා) | 1 | 1 | 0 | වාස්තු විද්‍යාඥ | 14 | 12 | 2 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (උපදේශක සේවා) | 1 | 0 | 1 | අභ්‍යන්තර නිර්මාණවේදී | 2 | 0 | 2 |
| අධ්‍යක්ෂ (ඉදිකිරීම්) | 3 | 3 | 0 | පරිපාලන නිලධාරී | 1 | 0 | 1 |
| අධ්‍යක්ෂ (ඉංජිනේරු නිර්මාණ) | 1 | 1 | 0 | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නිලධාරි | 1 | 0 | 1 |
| අධ්‍යක්ෂ (විදුලි හා යාන්ත්‍රික) | 1 | 0 | 1 | භාෂා පරිවර්තක | 1 | 0 | 1 |
| අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන හා කළමණාකරණ සංවර්ධන) | 1 | 0 | 1 | කාර්මික නිලධාරි | 94 | 64 | 30 |
| අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා) | 1 | 1 | 0 | ප්‍රමාණ සමීක්ෂණ සහකාර | 13 | 13 | 0 |
| අධ්‍යක්ෂ (පාලන) | 1 | 1 | 0 | සැලසුම් ශිල්පි | 40 | 38 | 2 |
| ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | 0 | සංවර්ධන නිලධාරී | 37 | 34 | 3 |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 | තාක්‍ෂණ සහකාර | 40 | 17 | 23 |
| නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (පාලන) | 1 | 0 | 1 | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සහකාර | 2 | 1 | 1 |
| ප්‍රධාන ඉංජිනේරු | 14 | 9 | 5 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 80 | 75 | 5 |
| ප්‍රධාන ඉංජිනේරු (යාන්ත්‍රික) | 1 | 0 | 1 | වෙනත් | 178 | 158 | 20 |
| ඉංජිනේරු | 70 | 51 | 19 | | | | |
| ගණකාධිකාරී | 9 | 3 | 6 | | | | |
| එකතුව | **108** | **73** | **35** | එකතුව | **505** | **412** | **93** |
| අනුමත සේවක සංඛ්‍යාව | **613** | දැනට සිටින සේවක සංඛ්‍යාව | | **485** | පුරප්පාඩු | | **128** |

## මානව සම්පත්-ශක්තිය

දෙපාර්තමේන්තුව සතු අතිමහත් ශක්තිය වන්නේ සිවිල්, විද්යුත් සහ යාන්ත්‍රික ක්ෂේත්‍රයන් ගේ වරලත් ඉංජිනේරුවරුන් සහ වරලත් වාස්තු විද්‍යාඥයන්, අභ්‍යන්තර නිර්මාණ ශිල්පීන් සහ තාක්ෂණික කාර්ය මණ්ඩලය යනාදී බහු වෘත්තික කාර්ය මණ්ඩලයයි.

ප්‍රධාන ඉංජිනේරුවන් 09ක්, ඉංජිනේරුවන් 51ක්, වාස්තු විද්‍යාඥයින් 12, තාක්ෂණ නිලධාරීන් 64, සැලසුම් ශිල්පීන් 38 ක් හා ප්‍රමාණ සමීක්ෂණ සහකරුවන් 13ක ගෙන් සමන්විත බහු ව්‍යාපෘති කාර්ය මණ්ඩලය ලෙස යොදා ගනිමින් දෙපාර්තමේන්තුව තම සේවය ලබා දෙයි

ගොඩනැගිලි සහ ඒ ආශ්‍රිත වැඩකටයුතුවල උපදේශන ආයතනය සහ පූර්ණ බලාධිකාරිය ලෙස මෙම වෘත්තීය කණ්ඩායම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී සහ ඒවායේ නීතිමය කටයුතු සම්බන්ධයෙන් විශේෂඥ උපදෙස් ලබාදීම සඳහා කැඳවනු ලබයි.

ඵලදායී සහ දූරදර්ශී නායකත්වය, සේවකයන් අතර සහයෝගය වැඩි කර ඉලක්ක සැපිරීම සඳහා සම්පත් යොදාගනිමින් ජයග්‍රහණ කරා ළඟා වීමට ඉවහල් වෙයි. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව හැකියාවෙන් පිරි, ස්ථාවර සහ සක්‍රිය නායකත්වයක් ලැබීමේ භාග්‍යය උදාකරගෙන ඇති අතර, ඔවුන් නොමැතිනම් ප්‍රගතිය සිහිනයක් වනු ඇත.

මෙහි පවතින එකම තර්ජනය වන්නේ පුද්ගලික සහ වෙනත් අංශයන්හි පවතින ආකර්ෂණය හේතුවෙන් තාක්ෂණික කාර්ය මණ්ඩලය දෙපාර්තමේන්තුව හැර යාමයි.

සියලුම පුරප්පාඩු සපුරා ඇතිනම්, සංවිධානයේ වර්ධනය, කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාව මෙන්ම සේවාව සැපයීමේ ආකාරය ද මෙයට වඩා ඉදිරියෙන් තිබෙනු ඇත.

### සේවක සංඛ්‍යාව

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 613 ක් වන අතර පවතින සේවක සංඛ්‍යාව 485 කි. ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 128 කි. පුරප්පාඩු සංඛ්‍යාව සැලකීමේ දී ඒ අතර 40 ක් දීප ව්‍යාප්ත සේවාවලට අයත් වේ. කෙසේ වෙතත් සංවිධානයේ වර්ධනය උදෙසා විශේෂයෙන්ම දෙපාර්තමේන්තු ගත තනතුරු පුරප්පාඩු සහ අනෙක් පුරප්පාඩු සියල්ල පිරවීමට උත්සහ ගන්නා ලද අතර 2018 වසරේදී එම දෙපාර්තමේන්තු ගත තනතුරු පිරවීමට සිදු කළ බඳවා ගැනීම් වගුව 14 මගින් පෙන්වා ඇත.

*වගුව 17.1 අනුමැතිය ලැබූ නව තනතුරු සඳහා 31.12.2018 දිනට බඳවා ගැනීම*

| තනතුර | සේවාව | පන්තිය/ශ්‍රේණිය | අනුමත නව තනතුරු- 2018 |
|---|---|---|---|
| අධ්‍යක්ෂ (විදුලි හා යාන්ත්‍රික) | SLES | I | 1 |
| අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන හා කළමණාකරණ සංවර්ධන) | SLES | I | 1 |
| වාස්තු විද්‍යාඥ | SLArchS | II/III | 4 |
| ගණකාධිකාරී | SLAcS | II/III | 4 |
| භාෂා පරිවර්ථක | TS | I/II | 1 |

*වගුව 17.2: නව බඳවා ගැනීම්*

| තනතුර | සේවාව | බඳවා ගත් ගණන |
|---|---|---|
| කාර්මික නිලධාරි | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය (කාර්මික නිළධාරී) | 02 |
| සැලසුම් ශිල්පීන් | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය ( සැලසුම් ශිල්පී ) | 09 |
| තාක්ෂණ සහකාර | දෙපාර්තමේන්තු පත්වීම් | 17 |
| රියැදුරන් | රියදුරු සේවය | 04 |
| කාර්යාල කාර්ය සහායක | කාර්යාල කාර්ය සහායක සේවය | 04 |
| ප්‍රාථමික මට්ටම -නුපුහුණු | දෙපාර්තමේන්තු පත්වීම් | 02 |

*වගුව 17.3: විශ්‍රාම ගැනීම්*

| සේවය | විශ්‍රාම ගැනීම් ගණන |
|---|---|
| ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 02 |
| ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | 01 |
| රාජ්‍ය කළමණාකරණ සහකාර සේවය | 01 |
| රියදුරු සේවය | 01 |
| දෙපාර්තමේන්තු පත්වීම් | 05 |

## ධාරිතා සංවර්ධනය:

සේවක සංඛ්‍යාවේ දැනුම වර්ධනය දීර්ඝකාලීනව ඉතා වැදගත් කාර්යයක් වන අතර පහත වගුව 18 මගින් 2018 වසරේදී පැවැත්වූ පුහුණු වැඩසටහන්වල විස්තර සහ පුහුණුව ලත් නිලධාරීන් ගණන පෙන්නුම් කෙරේ.

*වගුව 17: 2018 වසරේදී පැවැත්වූ පුහුණු වැඩසටහන් වල විස්තර සහ පුහුණුව ලත් නිලධාරීන් ගණන*

| අංකය | පුහුණු වැඩසටහනේ නම | ආයතනය/ සම්පත්දායකයා | පුහුණු කළ නිලධාරීන් සංඛ්‍යාව | නිලධර කාණ්ඩය | මුළු පිරිවැය (රුපියල්) |
|---|---|---|---|---|---|
| 1 | කොන්ත්‍රාත් සහ ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | 01 | කාර්මික නිලධාරි | 90,000.00 |
| 2 | රාජ්‍යය ආයතනයේ අභ්‍යන්තර විගණන නිලධාරීන් සඳහා කළමණාකරණ විගණනය පිළිබඳ ජාත්‍යන්තර වැඩසටහන | ශ්‍රී ලංකා මලයාසියානු පදනම | 01 | ප්‍රධාන අභ්‍යන්තර විගණක නිළධාරි | 188,600.00 |
| 3 | ISO 9001:2015 සඳහා අභ්‍යන්තර විගණනය පිළිබඳ ආයතනික වැඩමුළුව | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | 40 | සියලු නිලධාරි | 110,000.00 |
| 4 | Leaders Eat Last - USQ Sri Lanka Alumni Chapter | USQ Sri Lanka | 01<br>03 | අධ්‍යක්ෂ ජනරාල්<br>3 Officers | 10,000.00 |
| 5 | රාජ්‍යය අංශයේ අභ්‍යනතර විගණන ක්‍රියාව | Miloda Academy of Financial studies | 03 | කළමණාකරණ සහකාර සේවය | 18,000.00 |
| 6 | ආයතනික සාමාජිකත්වය වෙනුවෙන් සිවිල් ඉංජිනේරු උපාධි ඉංජිනේරුවන් පුහුණු කිරීම සඳහා සංවිධානයේ ඇගයීම සඳහා ඉල්ලුම් කිරීම | ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය | 01 | ඉංජිනේරු | 22,000.00 |
| 7 | කළමණාකරණ සහතික පාඨමාලාව | ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 11 | කාර්මික නිලධාරි / සැලසුම් ශිල්පීන් | 192,500.00 |
| **8** | නව බදු නීතිය | PRAG Service Pvt Ltd | 01 | ගණකාධිකාරි | 7,000.00 |
| 9 | Primavera p6 ව්‍යාපෘති කලමණාකරණ වැඩසටහන | ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය | 01 | ඉංජිනේරු | 22,500.00 |
| 10 | වාර්ෂික සැසිවාරය-2018 | ශ්‍රී ලංකා නිර්මිත ඉංජිනේරු සංගමය | 01 | ඉංජිනේරු | 17,000.00 |

| අංකය | පුහුණු වැඩසටහනේ නම | ආයතනය/ සම්පත්දායකයා | පුහුණු කළ නිලධාරීන් සංඛ්‍යාව | නිලධර කාණ්ඩය | මුළු පිරිවැය (රුපියල්) |
|---|---|---|---|---|---|
| 11 | ගිනි අනාවරණය හා ආරක්ෂණ පද්ධති නිර්මාණය කිරීම පිළිබඳ පාඨමාලාව | ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය | 01 | ඉංජිනේරු | 63,000.00 |
| 12 | ගිනි අනාවරණය හා ආරක්ෂණ පද්ධති නිර්මාණය කිරීම පිළිබඳ පාඨමාලාව | ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය | 01 | ඉංජිනේරු | |
| 13 | දෙපාර්තමේන්තු නිළධාරීන් සඳහා නායකත්ව පුහුනු වැඩසටහන | ජාතික තරුණ නාවුල | | සියලු නිලධාරි | 175,400.00 |
| 14 | මිනුම් කිරීම හා බිල්පත් සැකසීම | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | 04 | කාර්මික නිලධාරි | 20,000.00 |
| 15 | Structural Contract Compliance Criteria for Concrete & related Issues | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | 12 | ඉංජිනේරු | 32,000.00 |
| 16 | Professional Training (APT) Course | Green Building Council of SL | 01 | ඉංජිනේරු | 42,000.00 |
| 17 | තිරසාර ජලය පිළිබඳ වැඩමුළුව | Green Building Council | 01 | ඉංජිනේරු/ වාස්තු විද්‍යාඥ | 5,525.00 |
| 18 | GBCSL Associate Professional (APT) Course | Green Building Council | 05 | ඉංජිනේරු/ වාස්තු විද්‍යාඥ | 178,500.00 |
| 19 | බලශක්ති කළමනාකරණය ,අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලාව | ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය | 01 | ඉංජිනේරු | 35,000.00 |
| 20 | ISO 9001:2015 සඳහා අභ්‍යන්තර විගණනය පිළිබඳ ආයතනික වැඩමුළුව | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | 40 | සියලු නිලධාරි | 35,000.00 |
| 21 | ආයතනික සාමාජිකත්වය වෙනුවෙන් සිවිල් ඉංජිනේරු උපාධි ඉංජිනේරුවන් පුහුණු කිරීම සඳහා සංවිධානයේ ඇගයීම සඳහා ඉල්ලුම් කිරීම | ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය | සියලු | ඉංජිනේරු | 3,000.00 |
| 22 | Ready-mix Concrete වල නවීන පිළිවෙත් | ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය | 01 | ඉංජිනේරු | 14,000.00 |
| 23 | දියර පෙට්‍රෝලියම් ගෑස් සවි කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය | 02 | ඉංජිනේරු | 10,000.00 |
| 24 | පශ්චාත් උපාධි පාඨමාලාව සිවිල් ඉංජිනේරු - තිරසාර පරිසරයක් | විශ්ව විද්‍යාලය . පේරාදෙනිය | 01 | ඉංජිනේරු | 25,000.00 |

| අංකය | පුහුණු වැඩසටහනේ නම | ආයතනය/ සම්පත්දායකයා | පුහුණු කළ නිලධාරීන් සංඛ්‍යාව | නිලධර කාණ්ඩය | මුළු පිරිවැය (රුපියල්) |
|---|---|---|---|---|---|
| 25 | මිනුම් කිරීම සහ බිල්පත් සැකසීම | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | 01 | කාර්මික නිලධාරි | 25,000.00 |
| 26 | දක්ෂ නායකයෙකු වීමට සහ නායකත්වය සඳහා ඔබවම සොයා ගන්න | මානව සම්පත් කළමනාකරණ ආයතනය | 01 | පරිපාලන සේවය | 8,670.00 |
| 27 | යාන්ත්‍රික ඉංජිනේරු නිර්මාණ පිළිබඳ අඛණ්ඩ සංවර්ධනය පුහුණු පාඨමාලාව | ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය | 01 | ඉංජිනේරු | 39,000.00 |
| 28 | මිල උච්චාවචනය | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | 01 | ඉංජිනේරු | 10,000.00 |
| 29 | ගිනි ආරක්ෂනය ගොඩනැගීම- එක් දින පාඨමාලාව | ගිනි ඉංජිනේරු ආයතනය | 01 | ඉංජිනේරු | 8,500.00 |
| 30 | ගොඩනැගිලිවල සිරස් ප්‍රවාහනය | ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය | 01 | ඉංජිනේරු | 27,500.00 |
| 31 | ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි පාඨමාව | විශ්ව විද්‍යාලය. මොරටුව | 02 | වාස්තු විද්‍යාඥ | 200,000.00 |
| 32 | රාජ්‍යය අංශයේ අභ්‍යනතර විගණන ක්‍රියාව | Miloda Academy of Financial studies | 01 | කළමණාකරණ සහකාර | 36,000.00 |

## අභ්‍යන්තර විගණක වාර්තාව

**අභ්‍යන්තර විගණන අංශය**

අභ්‍යන්තර විගණන අංශය 2015 ජූනි මස ස්ථාපිත කරන ලදී .

### අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන පරමාර්ථය

මුදල් රෙගුලාසි 133 යටතේ අභ්‍යන්තර විගණන අංශ සඳහා වූ ප්‍රධාන පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා වාර්ෂිකව විගණන සැලසුම් සකස් කර, අනාවරණය වන කරුණු අනුව අභ්‍යන්තර පාලන පද්ධති හඳුන්වා දීම හා ආයතන සංග්‍රහයේ II වන කණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 29 වැනි ඡේදය අනුව  කටයුතු කිරීම.

*වගුව 19; කාර්ය මණ්ඩලය*

| අනු අංකය | තනතුර | නම |
|---|---|---|
| 1 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | එස්.නරසිංහ මෙය |
| 2 | සංවර්ධන නිලධාරි | කේ.ජී.එස්.ප්‍රියදර්ශනී මිය |
| 3 | රාජ්‍ය කළමනාකරණ සහකාර I | ඩබ්.පී. ජයන්ත රුද්‍රිගු මයා |
| 4 | රාජ්‍ය කළමනාකරණ සහකාර III | කේ.එල්.ඩී.එම්.අමරසිංහ මයා |
| 5 | රාජ්‍ය කළමනාකරණ සහකාර III III | ආර්.ඒ.උමේෂ් සංජය මයා |
| 6 | රාජ්‍ය කළමනාකරණ සහකාර III | එම්.එස්.පී.ශමිලා මිය |
| 7 | රාජ්‍ය කළමනාකරණ සහකාර III | බී.බාරතී මෙය |
| 8 | කාර්යාල කාර්ය සහායක | ඒ.ඒ.ගාමිණි තිලක් මයා |

**අභ්‍යන්තර විගණක වාර්ථාව -2018**

1. සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කරන ලද අභ්‍යන්තර විගණන සැලසුම, නිවාස, ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම් හා විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදී.
2. විගණක විසින් ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා 108 ක් ඉදිරිපත් කරනු ලැබ ඇත. මෙම වාර්තා වල පිටපත් මසකට වරක් අමාත්‍යාංශ ලේකම් වෙතද, මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව විගණකාධිපති වෙතද ඉදිරිපත් කර ඇත.
3. සමාලෝචිත වර්ෂය තුළදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04 ක් පවත්වා ඇත.
4. ඊට අමතරව පහත විෂයන්ට අනුකූලව වාර්තා ඉදිරිපත් කර ඇති අතර, වාර්තා ප්‍රමාණයද වගුව 18 මගින් දක්වා ඇත.

වගුව 20

| අනු අංකය | විෂය | ගණන |
|---|---|---|
| **1** | නීති-රීති රෙගුලාසි වලට අනුකූල නොවීම | 30 |
| **2** | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පරීක්ෂාව | 01 |
| **3** | අධ්‍යක්ෂ ජනරාල් පෞද්ගලික ගිණුම් පරීක්ෂාව | 08 |
| **4** | පද්ධති පාලන පරීක්ෂා කිරීම | 32 |
| **5** | වත්කම් පරීක්ෂා කිරීම් | 08 |
| **6** | ප්‍රධාන ඉංජිනේරු කලාප කාර්යාල පරීක්ෂාව | 01 |
| **7** | විශේෂ විමර්ශන | 04 |
| **8** | ව්‍යාපෘති ගෙවීම් පරීක්ෂාව | 24 |

# විගණකාධිපති වාර්ථාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සීඑන්/ජ්/බීඩී/එෆ්එස්/2018/01 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2019 මැයි 30 දින

අධ්‍යක්ෂ ජනරාල්

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

**ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.5 සහ 1.6 ඡේදවල දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග සැසඳීමේ දී මූල්‍ය නොවන වත්කම් අයිතමවල (ඒසීඒ 6 ප්‍රකාශනය පරිදි) 2017 දෙසැම්බර් 31 දිනට පැවැති ශේෂයන් හා 2018 ජනවාරි 01 දිනට වූ ශේෂයන් සමග සැසඳීමේ දී වත්කම් අයිතම 03 කට අදාලව රු.550,985,491 ක් වැඩියෙන් හා අයිතම 02 කට අදාලව රු.69,603,146 ක් අඩුවෙන් දක්වා තිබුණි. විස්තර පහත දැක්වේ.

| වත්කම් අයිතමය | 2017 මූල්‍ය ප්‍රකාශන පරිදි 2017.12.31 දිනට ශේෂය රු. | 2018 මූල්‍ය ප්‍රකාශන පරිදි 2018.01.01 දිනට ශේෂය රු. | වෙනස රු. |
|---|---|---|---|
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | - | 54,027,152 | 54,027,152 |
| නිවාස නොවන ගොඩනැගිලි | 90,390,493 | 150,870,000 | 60,479,507 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 12,418,313 | 448,897,145 | 436,478,832 |
| | **102,808,806** | **653,794,297** | **550,985,491** |
| වෙනත් යන්ත්‍ර හා උපකරණ | 48,446,149 | 45,674,100 | (2,772,049) |
| මැණික් රත්‍රං වැනි වටිනාකම් සහිත වත්කම් | 114,973,219 | 48,142,122 | (66,831,097) |
| එකතුව | **163,419,368** | **93,816,222** | **(69,603,146)** |

(ආ) ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කෙරේ.

**(අ) ආදායම් නොවන ලැබීම්**

දෙපාර්තමේන්තුවට ආදායම් ශීර්ෂයක් නොමැති අතර ආදායම් නොවන ලැබීම් වන රු.298,614,039 ක් ආදායම් ලැබීම් දක්වන මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ 1 ආකෘතියේ දක්වා තිබුණි.

**(ආ) පුනරාවර්තන වියදම්**

වාහන අළුත්වැඩියා සඳහා කරන ගෙවීම් වැඩ මූලිකවරයෙක් හෝ යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු සහතික කිරීමකින් තොරව රු. 1,709,603 ක අළුත්වැඩියා වියදම් ලෙස ගෙවා තිබුණි.

(ඇ) මූලධන වියදම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

දෙපාර්තමේන්තුව 2018 වර්ෂයේදී ප්‍රාග්ධන වැය විෂයයන් 07 කට ලද ප්‍රතිපාදනවලින් ඉතිරිවීම් රු.15,927,504 හෙවත් සියයට 55.03 ක ප්‍රතිශතයක් විය. තවද ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ වූ සමස්ත ඉතිරිවීම් වැඩසටහන් 01 ට අදාලව රු.11,538,482 ක් හා සියයට 48.5 ක්ද වැඩසටහන් 02 අදාලව රු.4,446,498 ක් හා සියයට 6.7 ක්ද විය.

(ඈ) දේපල පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය (ඒසීඒ 6) පරිදි ඉඩම්වල 2018 දෙසැම්බර් 31 දිනට අගය රු.450,826,091 ක් ලෙස දක්වා තිබුණි. ස්ථාවර වත්කම් ලේඛනය අනුව ඉඩම් මිලදී ගත් දිනයන්, අත්පත් කරගත් දිනයන්, මිලදී ගත් වටිනාකම්, අත්පත් කරගත් වටිනාකම් ඇතුළත් කර නොමැති හෙයින් වත්කම් ලේඛනය සමග වටිනාකම් සැසඳිය නොහැකි විය.

(ආ) 2018 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම් ලේඛනය අනුව වාහනවල අගය රු.148,470,000 ක් ලෙස දක්වා තිබුණද වාහන ලේඛනය අනුව වාහන 07 කට අදාලව අගය රු.2,845,000 කින් වැඩියෙන්ද එක් වාහනයක අගය රු.300,000 කින් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ඇ) ලිබඩු හා කාර්යාල උපකරණ (2102) සහ යන්ත්‍ර හා උපකරණ (2103) සඳහා වූ වර්ෂයේ දරන ලද ප්‍රාග්ධන වියදම් හා මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව වර්ෂයේ අදාල ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් අගය සමාන විය යුතු වුවත් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වර්ෂයේ එම වත්කම් අත්පත් කර ගැනීම් අගය එම දරන ලද වියදමට වඩා රු.10,559,475 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය පරිදි මූල්‍ය නොවන වත්කම් යටතේ දේපළ පිරියත හා උපකරණ අගය 2018 දෙසැම්බර් 31 දිනට රු.694,092,706 ක් ලෙස දක්වා තිබූ අතර ඒසීඒ 6 ප්‍රකාශය පරිදි අගය රු.748,119,858 ක් විය. ඒ අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් අගය රු.54,027,152 කින් අඩුවෙන් දක්වා තිබූ අතර දේපළ පිරියත හා උපකරණ සංචිතයද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.6.2 අත්තිකාරම් ගිණුම් ශේෂ

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ අංක 30901 දරන රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු පහත සඳහන් සීමාවන් දෙපාර්තමේන්තුව විසින් පිළිපැද තිබුණි.

| විෂය අංකය | වියදම රු. | | ලැබීම් රු. | | හර ශේෂය රු. | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව රු. | තථ්‍ය රු. | අවම සීමාව රු. | තථ්‍ය රු. | උපරිම සීමාව රු. | තථ්‍ය රු. |
| 30901 | 26,000,000 | 25,994,028 | 14,000,000 | 17,503,896 | 99,000,000 | 66,163,198 |

පහත සඳහන් නිරීක්ෂණයන් ද කරනු ලැබේ.

(අ) විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.297,461 ක ණය ශේෂ වසර 02 කට ආසන්න කාලයක සිට අයනොවී පැවතුණි.

(ආ) කාර්යාලීය කම්කරුවෙකු 2018 ජුනි මාසයේ සිට සේවය අතහැර ගොස් ඇතත් ඔහුගෙන් අයවිය යුතු රු.11,150 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| ඉඩම් පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ඉඩම් පවරා ගැනීම් හා ඊට අදාල වටිනාකම් යනාදිය යාවත්කාලීන කර නොතිබුණි. |
| බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 | 2018 වර්ෂයේ තොරතුරු යාවත්කාලීන කර නොතිබුණි. |

## 2- මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් මාසය දක්වා රු.2,915,800,000 ක අග්‍රිමයක් ඉල්ලුම් කිරීමට සැලසුම් කර තිබුණු අතර එම කාලපරිච්ඡේදයේ දී මාසිකව ඉල්ලුම් කළ එකතු අග්‍රිමය රු.5,778,394,000 ක් වූ අතර වර්ෂය තුළදී ලැබී තිබුණු අග්‍රිමය රු.1,633,628,900 ක් පමණක් විය.

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිසි කළමනාකාරිත්වයකින් වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද වැය විෂයයන් 04 ක ඇස්තමේන්තුවල සැලකිය යුතු විචලනයන් සිදු වී තිබුණි. ඇස්තමේන්තු විචලනයන් සෘණ රු.16,000 සිට රු.20,004,000 කින් හෙවත් සියයට 10.67 සිට සියයට 92.50 ක් දක්වා වී තිබුණි.

(ආ) අයවැය ඇස්තමේන්තු සැකසීමේ දී නිසි කළමනාකාරිත්වයකින් සැකසිය යුතු වුවද දෙපාර්තමේන්තුවේ වැඩ සටහන 2 සඳහා සමස්ත පුනරාවර්තන වියදම් මූලික ඇස්තමේන්තුවට වඩා සියයට 12.5 ක් පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් හා මු.රෙ. 66 මාරු කිරීම් මගින් සපයා ගෙන තිබුණි.

### 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2018 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ බැරකම් ලේඛනය නිසි පරිදි යාවත්කාලීන කර නොතිබූ අතර 2018 දෙසැම්බර් 31 දිනට වැඩසටහන් දෙකෙහිම වෙන් වෙන් වශයෙන් නොදක්වා දෙකෙහිම වැය විෂයන් සඳහා එකතුවක් ලෙස පිළියෙල කර ඉදිරිපත් කරන ලද බැරකම් වාර්තාව පරිදි රු.2,010,677 ක බැරකම් තිබුණත් මූල්‍ය ප්‍රකාශනවල බැරකම් කිසිවක් දක්වා නොතිබුණි.

(ආ) 2018 වර්ෂයේ වැඩසටහන් දෙකෙහිමද සමාන වැය විෂයයන්වල ඉතිරිවීම් එකතුවක් ලෙස ගෙන වාර්තාවේ බැරකම් සමග සැලකිල්ලට ගැනීමෙන් පසු වැය විෂයන් 10 ක ප්‍රතිපාදන රු.1,543,275 කින් ඉක්මවා තිබුණි.

**2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ගැනීම සඳහා විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් 2018 වර්ෂයේ දී ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට රු.2,214,967,537 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර එයින් වර්ෂය තුළදී රු.1,575,232,882 ක වියදම් දරා තිබුණු අතර වර්ෂය තුළදී රු.639,734,655 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එය සමස්ත ප්‍රතිපාදනයෙන් 29% ක් විය.

**2.5 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | |
| 2/2018 හා 2018 ජනවාරි 24 දිනැති චක්‍රලේඛය 1 පරිච්ඡේදය | සේවයේ නියුක්ත සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම 2018 වර්ෂයේ සිට සිදු කළ යුතු වුවත් එවැනි කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම් කර නොතිබුණි. |
| 6.1 පරිච්ඡේදය | දෙපාර්තමේන්තුව 2016 – 2020 කාලපරිච්ඡේදය සඳහා පුහුණු අවශ්‍යතා සඳහා සැලැස්මක් පිළියෙල කර තිබුණත් එය උක්ත චක්‍රලේඛ විධිවිධාන පරිදි කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙක් සඳහාම අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් මානව සම්පත් සංවර්ධන සැලැස්ම තුළ සහතික යුතු වුවත් දෙපාර්තමේන්තුව 2018 වර්ෂයේ දී පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොදවා ඇති ආකාරය අනුව එසේ කටයුතු කර නොතිබුණි. |
| **(ආ) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛය** | |
| එන්පී/එස්පී/එස්ඩීජී/17 හා 2017 අගෝස්තු 14 දිනැති චක්‍රලේඛය | තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට දෙපාර්තමේන්තුව 2018 වර්ෂයේ දී කටයුතු කර නොතිබුණි. |

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 භාණ්ඩ සහ වැඩ

| | |
|---|---|
| 8.9.1 ඡේදය | ලංසුකරු විසින් ඉදිරිපත් කරන ලද ලංසුව ප්‍රතිග්‍රහණය කිරීමෙන් පසු ආයතනය විසින් අදාල ලංසුකරු වෙත වහාම විධිමත් ප්‍රතිග්‍රහණය ලිපියක් නිකුත් කල යුතුය. ඒ සමගම විධිමත්, කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කිරීම සිදු කල යුතු වුවත් රු.717,000 ක් (එකතු කළ අගය මත බදු හැර) වටිනා කන්ටේනර් බහාලුම මිලදී ගැනීමේ දී එසේ කටයුතු කර නොතිබුණි. |
| 8.9.3 ඡේදය | මිලදී ගන්නා ලද කන්ටේනර් බහාලුම සඳහා විධිමත් කොන්ත්‍රාත්තුව අදාල අධිකාරිය විසින් අත්සන් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. |

## 3 -මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන Turnkey ව්‍යාපෘති අතුරින් රුපියල් මිලියන 57.86 ක පිරිවැයට ඇස්තමේන්තු කර තිබූ ව්‍යාපෘති 12 ක කිසිදු කාර්ය සාධනයක් අත්පත් කරගෙන නොතිබුණු අතර ඊට අමතරව රුපියල් මිලියන 217.67 ක Turnkey ව්‍යාපෘති 18 කට අදාල කාර්යසාධනය සියයට 4 සිට සියයට 46 දක්වා විය.

### 3.2 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ පහත සඳහන් දැක්වෙන වාහන භාවිතා කර නොතිබුණි.

| වාහන අංකය | වටිනාකම රු. | ධාවනය නොකර පැවති කාලය |
|---|---|---|
| 18 - 4040 | 700,000 | අවුරුදු 02 |
| LA - 7155 | 950,000 | මාස 06 |

ජාතික විගණන කාර්යාල
தேசிய கணக்காய்வு அலுவலக
NAOSL NATIONAL AUDIT OFFICE

**3.3 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2018 වර්ෂයේ ඔක්තෝබර් මස රු.717,000 ක් (එකතු කළ අගය මත බදු නොමැතිව) ගෙවා පෞද්ගලික සමාගමකින් මිලදී ගන්නා ලද රියදුරු විවේකාගාරය සඳහා දැනට භාවිතා කරනු ලබන කන්ටේනර් බහාලුමේ පිහිටි වැසිකිලි සඳහා ජලය නොසැපයීම හා වැසිකිලි වල නොතිබීම හේතුවෙන් වැසිකිලිය භාවිතයට ගැනීමට නොහැකිව තිබෙන බව 2019 මැයි මස 14 දින කරන ලද භෞතික පරීක්ෂාවේ දී අනාවරණය විය.

(ආ) ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයට අයත් කම්කරු III ශ්‍රේණියේ තනතුරු 34 ක් සඳහා බඳවා ගැනීම ලකුණු අනුපිළිවෙල අනුව පත්වීම් ලබා දිය යුතු වුවත් ලකුණු ලබාගත් අනුපිළිවෙල අනුව පත්වීම් ලබා දී නොතිබුණි. සමාන ලකුණු 35 බැගින් ලබාගත් 34 වෙනියා සහ 35 වෙනියා 14 වෙනි හා 29 වෙනි ස්ථානවලට ඇතුළත් කර ලකුණු 38 ක් ලබාගත් පුද්ගලයාට පත්වීම් ලබා දී නොතිබුණි.

ලකුණු 38 ලබාගත් පත්වීම හිමි පුද්ගලයාට පත්වීම් ලිපිය තැපැලෙන් යොමු කළ බව සඳහන් ලිපියක් ආයතන ප්‍රධානියාගේ අත්සනින් යුතුව නිකුත් කර තිබුණ නමුත්, කිසිදු පත්වීම් ලාභියෙකුට පත්වීම් ලිපි ලියාපදිංචි තැපැලෙන් යැවූ බවට ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

**3.4 පාඩු හා හානි**

2017 විසර්ජන ගිණුම පරිදි තවදුරටත් අයකර ගැනීමට කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය පරිදි වාහන 04 ක අදාල අනතුරු 04 ක් සම්බන්ධයෙන් අයකර ගත යුතු රු.388,167 ක අලාභයක් ඇතත් 2018 වර්ෂයේ දී එම අලාභ අයකර ගැනීම හෝ කපා හැරීම හෝ මූල්‍ය ප්‍රකාශන හා ලේඛන පරිදි අනාවරණය නොවුවත් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එම අලාභයන් පිළිබඳ විස්තර ඇතුළත් කර නොතිබුණි.

## 4- තිරසාර සංවර්ධනය

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අංක NP/SP/SDG/17 හා 2017 අගෝස්තු 14 දිනැති චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට දෙපාර්තමේන්තුව මේ දක්වාම කටයුතු කර නොතිබුණි.

## 5- මානව සම්පත් කළමනාකරණය

### 5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

2018 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 126 | 85 | 41 |
| (ii) | තෘතියික මට්ටම | 24 | 04 | 20 |
| (iii) | ද්විතියික මට්ටම | 285 | 238 | 47 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 178 | 158 | 20 |
| (v) | වෙනත් (කොන්ත්‍රාත් පදනම) | - | 23 | - |
| | එකතුව | **611** | **508** | **128** |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

i. පුරප්පාඩු 128 ක් පිරවීමට දෙපාර්තමේන්තුව මේ දක්වාම අපොහොසත් වී තිබුණි.

ii. දෙපාර්තමේන්තුවේ එක් රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරියෙක් 2011 සැප්තැම්බර් 15 දින සිට ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත නිදහස් කර ඇති අතර ඒ සඳහා 2018 සැප්තැම්බර් දක්වා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ වැටුප් ගෙවා තිබුණි.

එම්.කේ.ඩී. රේණුකා
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.